| 2025<br>අප්‍රේල් | ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය<br>නිෂ්පාදන සහ සේවා | STATISTICS DEPARTMENT<br>CENTRAL BANK OF SRI LANKA |
|---|---|---|

**2025 අප්‍රේල් මාසයේ දී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින්, පෙර වසරවල අප්‍රේල් මාසය තුළ පැවති රටාවට අනුගත වෙමින් නිෂ්පාදන ක්‍රියාකාරකම්වල පහත වැටීමක් පෙන්නුම් කරන අතර, සේවා ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කරයි.**

**පසුගිය වසරවල අප්‍රේල් මාසය තුළ පැවති රටාවට අනුගත වෙමින්, නිෂ්පාදන අංශයේ ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2025 අප්‍රේල් මාසයේ දී දර්ශකාංක 40.1 දක්වා පහත වැටුණි.** නිෂ්පාදන, නව ඇණවුම්, තොග මිලදී ගැනුම් සහ සේවා නියුක්තිය යන ප්‍රධාන උප දර්ශක පහත වැටීම හේතුවෙන්, සාමාන්‍යයෙන් ඉහළ දර්ශක අගයක් වාර්තා කරනු ලබන මාර්තු මාසයට සාපේක්ෂව සැලකීමේ දී මෙම මාසය තුළ දී සමස්ත දර්ශකය පහත වැටුණි.

සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූවන්ට අනුව, නව ඇණවුම් උප දර්ශකයේ පහත වැටීම සඳහා උත්සව සමයේ පැවති ඉල්ලුම අඩුවීමත් සමගම, විශේෂයෙන් ආහාර හා පාන අංශයේ නව ඇණවුම් පහත වැටීම ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, නිෂ්පාදන උප දර්ශකයේ පහත වැටීමට සිංහල සහ දෙමළ අලුත් අවුරුදු සමයේදී බොහොමයක් කර්මාන්තශාලා සිය මෙහෙයුම් කටයුතු තාවකාලිකව නවතා දැමීමෙන් අප්‍රේල් මාසයේ වැඩ කරන දින ගණන අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු විය. පෙර වසරවල පැවති රටාවට අනුව නිෂ්පාදන අවශ්‍යතාවන්ට අනුකූලව නිෂ්පාදකයින් තාවකාලික ශ්‍රම සැපයුම අඩු කිරීමත් සමඟ සේවා නියුක්ති උප දර්ශකය අප්‍රේල් මාසයේ දී පහත වැටුණි. තවද, නව ඇණවුම් සහ නිෂ්පාදනය පහත වැටීමත් සමග අප්‍රේල් මාසයේදී තොග මිලදී ගැණුම් උප දර්ශකය ද පහත වැටුණි. මේ අතර, ප්‍රධාන වශයෙන්, උත්සව සමයේදී සැපයුම් දාමයන්ට ඇති වූ බාධා හේතුවෙන්, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය අප්‍රේල් මාසයේ දී තවදුරටත් වැඩි විය.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**


| විචල්‍යය | මාර්. | අප්‍රේ. | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **63.9** | **40.1** | **-** | **ඉහළ යෑමක සිට පහත වැටීමක්** |
| නව ඇණවුම් | 71.2 | 36.5 | - | ඉහළ යෑමක සිට පහත වැටීමක් |
| නිෂ්පාදන | 70.2 | 30.0 | - | ඉහළ යෑමක සිට පහත වැටීමක් |
| සේවා නියුක්තිය | 51.9 | 44.9 | - | ඉහළ යෑමක සිට පහත වැටීමක් |
| තොග මිලදී ගැනුම් | 62.0 | 41.0 | - | ඉහළ යෑමක සිට පහත වැටීමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 56.3 | 57.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉල්ලුම් තත්ත්වයන්හි අපේක්ෂිත වර්ධනයන් හේතුවෙන්, ඉදිරි මාස තුනක කාලය සඳහා නිෂ්පාදන ක්‍රියාකාරකම් සඳහා වන අපේක්ෂා ඉහළ මට්ටමක පවතී.

| නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය<br>2025 අප්‍රේල් | **40.1** |
|---|---|

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා
### නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්

| රට / කලාපය | දිශානතිය |
|---|---|
| ගෝලීය | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ඉන්දියාව | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| චීනය | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් ජනපදය | සමාන වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් රාජධානිය | අඩු වේගයකින් පහත වැටීමක් |
| යුරෝපා කලාපය | අඩු වේගයකින් පහත වැටීමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2025 මැයි 16 වන දිනට (PMI Releases (spglobal.com))*

[1] *එස් &පී ග්ලෝබල් (S&P Global) ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, සේවා ක්‍රියාකාරකම්වල මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කරමින් 2025 අප්‍රේල් මාසයේ දී 60.6ක අගයක් වාර්තා කළේය.**

ව්‍යාපාර ක්‍රියාකාරකම් 2025 අප්‍රේල් මාසයේ දී ඉහළ යෑම සඳහා අංශ කිහිපයක සිදු වූ වර්ධනයන් හේතු විය. ඒ අනුව, තොග සහ සිල්ලර වෙළඳාම හා සම්බන්ධ ව්‍යාපාර ක්‍රියාකාරකම් උත්සව සමයේ පැවති ඉල්ලුම හේතුවෙන් සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. තවද, ණය දීම් ඉහළ යෑම හේතුවෙන් මූල්‍ය සේවා හා සම්බන්ධ ව්‍යාපාර ක්‍රියාකාරකම් අඛණ්ඩව වර්ධනය විය. කෙසේ වෙතත්, අප්‍රේල් මාසයේ නිවාඩු දින රැසක් පැවතීම හේතුවෙන් සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම්වලට යම් බලපෑමක් එල්ල වූ අතර, විශේෂයෙන් ඇමරිකා එක්සත් ජනපදය විසින් පනවන ලද ආනයන තීරුබදු සම්බන්ධයෙන් පැවති අවිනිශ්චිතතා භාණ්ඩ ප්‍රවාහන කටයුතු හා සම්බන්ධ සමාගම්වල ව්‍යාපාර ක්‍රියාකාරකම්වලට බලපෑවේය.

ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා සහ තොග සහ සිල්ලර වෙළඳාම ආශ්‍රිත කටයුතුවල සිදු වූ වර්ධනයන් සමඟ, 2025 අප්‍රේල් මාසයේ දී නව ව්‍යාපාරවල ඉහළ යෑමක් දක්නට ලැබුණි.

සමාගම් කිහිපයක සිදුකළ නව බඳවා ගැනීම් හේතුවෙන් සේවා නියුක්තිය අඛණ්ඩව ඉහළ ගියේය. මේ අතර, නිම කිරීමට නියමිත කාර්යයන් 2025 අප්‍රේල් මාසයේ දී අඛණ්ඩව පහළ ගියේය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | මාර්. | අප්‍රේ. | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)** | **69.8** | **60.6** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| නව ව්‍යාපාර | 68.3 | 56.7 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 61.9 | 55.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| නිම කිරීමට නියමිත කාර්යයන් | 48.4 | 47.5 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 73.0 | 75.8 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් සඳහා වූ අපේක්ෂාවන්, 2025 අප්‍රේල් මාසයේ දී අඛණ්ඩව ඉහළ වේගයකින් වර්ධනය වූ අතර, මේ සඳහා ඇමරිකා එක්සත් ජනපදය විසින් පනවන ලද ආනයන තීරුබදු තාවකාලිකව අත්හිටුවීම හේතු විය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)** **60.6**

**2025 අප්‍රේල්**

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා**

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට/ කලාපය | දිශානතිය |
|---|---|
| ගෝලීය | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ඉන්දියාව | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| චීනය | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් ජනපදය | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් රාජධානිය | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| යුරෝපා කලාපය | අඩු වේගයකින් ඉහළ යෑමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2025 මැයි 16 වන දිනට*

**තාක්ෂණික සටහන:**

**ක්‍රමවේදය**

ප්‍රශ්නාවලිය ඊළඟ මාසයේ පළමු භාගයේ දී සම්පූර්ණ කෙරේ. සෑම විචල්‍යයක් සඳහාම, පෙර මාසය හා සසඳන විට වැඩි වීමක්, අඩුවීමක් හෝ නොවෙනස්ව පැවතීමක් ද යන්න වාර්තා කිරීමට ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ඉල්ලා සිටින අතර, යම් වෙනසක් සඳහා හේතු දැක්වීමට ඉල්ලා සිටිනු ලැබේ. දර්ශක සම්පාදනය සහ අර්ථ නිරූපණය සඳහා එස්&පී ග්ලෝබල් (S&P Global) ආයතනයෙහි සමීක්ෂණ ක්‍රමවේදය අනුගමනය කරයි.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** නිෂ්පාදන ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස සැලකෙන අතර, නව ඇණවුම්, නිෂ්පාදන, සේවා නියුක්තිය, තොග මිලදී ගැනුම් සහ ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප-දර්ශකයන්ගේ භරිත සාමාන්‍යයකි.

පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සේවා ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස ගැනෙන අතර, එය **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** ලෙස හඳුන්වනු ලබයි. තවද, සේවා අංශයේ සේවා ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය සමඟ සැසඳිය හැකිය.

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිම කිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.